සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 09 - 2024

### තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I

පැය 01.30

නම/විභාග අංකය :

01. පහත පරිශීලක වර්ග අතරින් පද්ධති පරිශීලක වර්ගයට අයත් නොවන්නේ කුමන පරිශීලක ද?
 1) ක්‍රමලේඛක 2) ජාල පරිපාලක
 3) පරිගණක යෙදවුම් සහායක 4) වෙබ් සංවර්ධක

02. “.................. යනු නිශ්චිත ස්ථානයක තබා භාවිතා වන පරිගණකයකි.” හිස්තැන සඳහා වඩාත් සුදුසු පරිගණක වර්ගය වන්නේ,
 1) මේස පරිගණකය 2) උකුල් පරිගණකය 3) සුහුරු දුරකථනය 4) නෝට් බුක් පරිගණකය

03. ආදාන හා ප්‍රතිදාන යන කාර්යයන් දෙකම සිදු කර ගත හැකි පර්යන්ත උපාංගයක් වන්නේ මින් කුමක් ද?
 1) සැනෙලි ධාවකය 2) සංදර්ශකය 3) යතුරු පුවරුව 4) ස්පර්ශක තිරය

පහත දැක්වෙන්නේ පරිගණක පද්ධතියක විස්තර කිහිපයකි. ඒ ඇසුරින් 04 හා 05 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

System › About

| | | |
|---|---|---|
| Processor | AMD Ryzen 7 5800H with Radeon Graphics | 3.20 GHz |
| Installed RAM | 16.0 GB (15.3 GB usable) | |
| Device ID | 99712CF2-5FBA-40C6-812D-03401AB7671B | |
| Product ID | 00342-42593-09274-AAOEM | |
| System type | 64-bit operating system, x64-based processor | |
| Pen and touch | No pen or touch input is available for this display | |

04. මෙම පරිගණකයේ සකසනයේ වර්ගය කුමක් ද?
 1) AMD 2) Ryzen 7 3) CPU 4) 3.20GHz

05. මෙම පරිගණකයේ ප්‍රධාන මතක ධාරිතාව කොපමණද?
 1) 2GB 2) 4GB 3) 8GB 4) 16GB

06. USB කෙවෙනිය භාවිතයෙන් පරිගණකයට සම්බන්ධ නොකරන පර්යන්ත උපාංගය වන්නේ,
 1) මුද්‍රණ යන්ත්‍රය 2) සංදර්ශකය 3) මූසිකය 4) වෙබ් කැමරාව

07. සුහුරු දුරකථන වැනි ජංගම උපාංග සඳහා බහුලව යොදා ගැනෙන මෙහෙයුම් පද්ධතියක් වන්නේ,
 1) ලිනක්ස් (Linux) 2) උබුන්ටු (Ubuntu)
 3) ඇන්ඩ්‍රොයිඩ් (Android) 4) වින්ඩෝස් (Windows)

08. නිදහස් විවෘත ප්‍රභව මෙහෙයුම් පද්ධතියක් නොවන්නේ මින් කුමක්ද?
 1) ලිනක්ස් (Linux) 2) උබුන්ටු (Ubuntu)
 3) ඇන්ඩ්‍රොයිඩ් (Android) 4) වින්ඩෝස් (Windows)

09. පරිගණකයක් මිල දී ගැනීමේ දී සලකා බැලිය යුතු තාක්ෂණික නොවන පිරිවිතරයක් වන්නේ,

1) තිරයේ ප්‍රමාණය
2) අලෙවියෙන් පසු සේවාව
3) දෘඪ තැටියේ ධාරිතාව
4) සකසනයේ වර්ගය

10. වැඩපතක ඉංග්‍රීසි අක්ෂරවලින් ලේබල් කර ඇත්තේ පහත ඒවායින් කවරක්ද?

1) පේළි (Row)
2) කෝෂ (Cell)
3) තීරු (Column)
4) කෝෂ පරාසය (Cell Range)

11.  මෙම රූපයෙන් දැක්වෙන ප්‍රස්ථාර වර්ගය වන්නේ,

1) තීරු
2) ස්ථම්භ
3) රේඛා
4) වට

12. කෝෂ පරාසයක ඇති සංඛ්‍යාත්මක අගයන් ගණන හා අක්ෂර ඇතුලත් කෝෂ ගණන ලබා ගැනීම සඳහා භාවිතා වන ශ්‍රිතය කුමක් ද?

1) Count
2) CountA
3) Sum
4) Max

13. විද්‍යුත් පැතුරුම්පත් මෘදුකාංගයෙහි ශ්‍රිතයක් ලිවීමේ නිවැරදි ක්‍රමවේදය වන්නේ


1) =SUM(A1:C1)
2) SUM=(A1:C1)
3) SUM(A1:C1)
4) = SUM[A1:C1]

14. කෝෂ හැඩසව් කිරීමේ මෙවලම් අතරින් අකුරු ඇල කිරීම සඳහා භාවිතා වන මෙවලම කුමක්ද?

1) Bold
2) Italic
3) Underline
4) Wrap Text

15. පහත දක්වා ඇති වැඩපතෙහි අඳුරු කර ඇති ප්‍රදේශය කෝෂ පරාසයක් ලෙස ලියා ඇති පිළිතුර වන්නේ,




1) A1:C1
2) B2:D2
3) B2:D3
4) C2:D3




16. ගැටළුවක් විශ්ලේෂණයේ දී හඳුනා ගත යුත්තේ,

1) ආදානය
2) සැකසීම
3) ප්‍රතිදානය
4) ඉහත සියල්ලම


17. "සංඛ්‍යාව ප්‍රතිදානය කරන්න" යන ප්‍රකාශයට වඩාත් ගැලපෙන ගැලීම් සටහන් සංකේතය වන්නේ

1) 
2) 
3) 
4) 

18. නීඩිත පුනර්කරණය තුළ ඇතුලත් වන්නේ

1) තේරීම තුළ තේරීම
2) තේරීම තුළ පුනර්කරණය
3) පුනර්කරණය තුළ පුනර්කරණය
4) පුනර්කරණය තුළ තේරීම

19. Scratch හි භාවිතා වන පහත දැක්වෙන කොටස භාවිතා වන්නේ




1) තේරීම සඳහා
2) නිශ්චිත වාර ගණනක් පුනර්කරණය සඳහා
3) කොන්දේසිය සත්‍ය වන තුරු පුනර්කරණය සඳහා
4) අසීමිත වාර ගණනක් පුනර්කරණය සඳහා

20. අගයන් විශාල ප්‍රමාණයක් එකම නාමයකින් තැන්පත් කිරීමට යොදාගනු ලබන දත්ත ව්‍යුහය වන්නේ,

1) අරාව
2) සංකේතය
3) විචල්‍යය
4) ක්‍රමලේඛය

(ලකුණු 2x20=40)

සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP


## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 09 - 2024

### තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය II

නම/විභාග අංකය :

* **සියළුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.**
* **II කොටසට පිළිතුරු ලිවීම සඳහා වෙනම කොළ භාවිතා කරන්න.**

01. i. පහත රූපසටහනේ ඉංග්‍රීසි අක්ෂර මගින් ලේබල් කර ඇති උපාංග නම් කරන්න.




(ලකුණු 07)

ii. පහත පරිශීලක හා ඔවුන්ගේ කාර්යය නිවැරදිව ගළපන්න.

| පරිශීලක | කාර්යය |
|---|---|
| ක්‍රමලේඛක | වෙබ් අඩවි සැලසුම් කිරීම හා සංවර්ධනය |
| ජාල පරිපාලක | පරිගණක ක්‍රමලේඛ සංවර්ධනය |
| පද්ධති විශ්ලේෂක | මෘදුකාංග නිර්මාණය කිරීම |
| මදුකාංග ඉංජිනේරු | පරිගණක ජාල පරිපාලනය හා නඩත්තුව |
| වෙබ් සංවර්ධක | තොරතුරු පද්ධති සැලසුම් කිරීම |

(ලකුණු 05)

iii. a. පරිගණකයක් මිල දී ගැනීමේදී සැලකිළිමත් විය යුතු තාක්ෂණික පිරිවිතර 3 ක් හා තාක්ෂණික නොවන පිරිවිතර 2ක් සඳහන් කරන්න. (ලකුණු 05)

iv. පරිගණකයක් මිල දී ගැනීමේදී පාරිභෝගිකයාට ලැබෙන වගකීම් ආකාර 3ක් සඳහන් කරන්න. (ලකුණු 03) (මුළු ලකුණු 20)

02. පහත දැක්වෙන පැතුරුම්පත ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | A | B | C | D | E | F | G |
|---|---|---|---|---|---|---|---|
| 1 | Marksheet – Grade 09 | | | | | | |
| 2 | Name | Science | Maths | Sinhala | English | Total | Average |
| 3 | Amal | 50 | 55 | 60 | 63 | | |
| 4 | Kamal | 70 | 72 | 60 | 65 | | |
| 5 | Namal | 75 | 74 | 68 | 78 | | |
| 6 | Wimal | 80 | 78 | 85 | 88 | | |
| 7 | Piyumal | 79 | 85 | 83 | 80 | | |
| 8 | Lakmal | 78 | 77 | 80 | 87 | | |
| 9 | Maximum Mark | | | | | | |
| 10 | Minimum Mark | | | | | | |

i. අමල්ගේ ලකුණු වල මුළු එකතුව F3 කෝෂයට ලබා ගැනීම සඳහා ඇතුලත් කල යුතු සූත්‍රය ශ්‍රිත භාවිතයෙන් ලියා දක්වන්න.

ii. නාමල්ගේ ලකුණු වල මුළු එකතුව ලබා ගැනීම සඳහා එම ආකාරයේම සූත්‍රයක් (01 හි සඳහන්) භාවිතා කරන ලද්දේ නම් F5 කෝෂයේ පෙන්වන සූත්‍රය සඳහන් කරන්න.

iii. අමල්ගේ ලකුණු වල සාමාන්‍යය ලබා ගැනීම සඳහා G3 කෝෂයට ඇතුලත් කල යුතු සූත්‍රය දක්වන්න.


iv. විද්‍යාව විෂයයේ වැඩිම ලකුණ ලබා ගැනීමට B9 කෝෂයට ඇතුලත් කල යතු සූත්‍රය කුමක් ද?

v. ගණිත විෂයේ අඩුම ලකුණ සොයා ගැනීමට C10 කෝෂයේ සඳහන් විය යුතු සූත්‍රය දක්වන්න.

(ලකුණු 3 x 5 = 15)

03. උසස් පෙළ සිසුවෙකුගේ නම විෂයන් 3 හි ලකුණු ඇතුළත් කළ විට එහි එකතුව හා සාමාන්‍ය අගය සොයා එකතුව 150 ට වැඩි නම් 'Very good' ලෙසත් නැත්නම් 'You should work hard' ලෙසත් මුද්‍රණය කිරීමට ගැලීම් සටහනක් අඳින්න. ඒ සඳහා පහත ආකෘතිය භාවිතා කරන්න.


( අවසානය , ආරම්භය , සාමාන්‍ය ගණනය කිරීම , එකතුව ගණනය කිරීම , 'Very good' ලෙස ප්‍රදර්ශනය කිරීම , එකතුව 150 ට වැඩි? , 'You should work hard' ලෙස ප්‍රදර්ශනය කිරීම , විෂයන් 03 හි ලකුණු ඇතුලත් කිරීම , ඔව් , නැත )




(ලකුණු 15)

04. දවසේ උෂ්ණත්වය ඇතුලත් කළ විට එහි අගය $40^0C$ ට වඩා වැඩි නම් "VERY HOT" ලෙසත්, අගය $30^0C$ ට වඩා වැඩි නම් " HOT" ලෙසත් , අගය $20^0C$ ට වඩා වැඩි නම් " COLD" ලෙසත් ඊට අඩු නම් "VERY COLD" ලෙසත් දර්ශනය වන වැඩ සටහනකට අදාලව Scratch ක්‍රමලේඛය පහත දැක්වේ. එයට අදාල අසම්පූර්ණ ගැලීම් සටහන ද පහත දක්වා ඇත. එහි ඉංග්‍රීසි අක්ෂර මගින් දක්වා ඇති ලේබල් සඳහා සුදුසු වචන ලියා දක්වන්න.




(ලකුණු 1x10=10)

සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 09 - 2024

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I,II

පිළිතුරු

### I කොටස

| ප්‍රශ්ණ අංකය | පිළිතුර | ප්‍රශ්ණ අංකය | පිළිතුර | ප්‍රශ්ණ අංකය | පිළිතුර | ප්‍රශ්ණ අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 06 | 2 | 11 | 2 | 16 | 4 |
| 02 | 1 | 07 | 3 | 12 | 2 | 17 | 1 |
| 03 | 4 | 08 | 4 | 13 | 1 | 18 | 3 |
| 04 | 2 | 09 | 2 | 14 | 2 | 19 | 4 |
| 05 | 4 | 10 | 3 | 15 | 3 | 20 | 1 |

(ලකුණු 2x20=40)

### II කොටස

01

i
A – මුද්‍රණ යන්ත්‍රය
B – සංදර්ශකය/ පරිගණක තිරය
C – පද්ධති ඒකකය
D – මයික්‍රෆෝනය
E – යතුරු පුවරුව
F – මූසිකය
G – නාදකය

(ලකුණු 7)

ii

| | |
|---|---|
| ක්‍රමලේඛක | - පරිගණක ක්‍රමලේඛ සංවර්ධනය |
| ජාල පරිපාලක | - පරිගණක ජාල පරිපාලනය හා නඩත්තුව |
| පද්ධති විශ්ලේෂක | - තොරතුරු පද්ධති සැලසුම් කිරීම |
| මදුකාංග ඉංජිනේරු | - මෘදුකාංග නිර්මාණය කිරීම |
| වෙබ් සංවර්ධක | - වෙබ් අඩවි සැලසුම් කිරීම හා සංවර්ධනය |

(ලකුණු 5)

iii

a. <u>තාක්ෂණික පිරිවිතර</u>

සකසනයේ වර්ගය
සකසකයේ වේගය
පරිගණක තිරයේ වර්ගය
පරිගණක තිරයේ ප්‍රමාණය
දෘඩ තැටියේ ධාරිතාව
ප්‍රධාන මතක ධාරිතාව
ස්ථාපිත මෘදුකාංග

** ඕනෑම 3ක්*

<u>තාක්ෂණික නොවන පිරිවිතර</u>

පරිගණකයේ මිල
වගකීම් කාලය
අලෙවියෙන් පසු සේවාව
සමාගමේ කීර්ති නාමය

** ඕනෑම 2ක්*

(ලකුණු 5)

b.
නිෂ්පාදක වගකීම
දීර්ඝ කළ වගකීම
වැඩබිමේ වගකීම

(ලකුණු 3)


(මුළු ලකුණු 20)

02.

i. =SUM(B3:E3)
ii. =SUM(B5:E5)
iii. =AVERAGE(B3:E3)
iv. =MAX(B3:B8)
v. =MIN(C3:C8)

(ලකුණු 3x5=15)

03.




(ලකුණු 1.5x10=15)

04.

A – ආරම්භය
B – උෂ්ණත්වය ඇතුලත් කරන්න
C – උෂ්ණත්වය 40 ට වැඩි ද?
D – "ඉතා උණුසුම්" ලෙස ප්‍රතිදානය
E – උෂ්ණත්වය 30 ට වැඩි ද?
F – "උණුසුම්" ලෙස ප්‍රතිදානය
G – උෂ්ණත්වය 20 ට වැඩි ද?
H – "සීතල" ලෙස ප්‍රතිදානය
I – "ඉතා සීතල" ලෙස ප්‍රතිදානය
J – අවසානය

(ලකුණු 1x10=10)